16



# සුන්නත් හි වැදගත්කම



ඉස්ලාමයේ අල්කුර්ආනය ට පසුව දෙවන මූලාශ්‍රයය වශයෙන් සුන්නත් (සුන්නා) හැඳින්විය හැකි ය. අල් කුර්ආනය අනුගමනය කරමින් ජීවත් වූ නබි (සල්) තුමාගේ ජීවිතය සහ ප්‍රකාශ සුන්නත් යනුවෙන් නිර්වචනය කළ හැකි ය. සුන්නත් 'හදීස්' යනුවෙන් ද ව්‍යවහාර කරනු ලැබේ. සුන්නත් ඉස්ලාමයේ මූලික මූලාශ්‍රයයක් ලෙස අල් කුර්ආනය සහ සුන්නාව ස්තිරව ප්‍රකාශ කර ඇත.

## සුන්නත් පිළිබඳ අල් කුර්ආනයේ සඳහන් කරුණු

قُلْ إِن كُنتُمْ تُحِبُّونَ ٱللَّهَ فَٱتَّبِعُونِى يُحْبِبْكُمُ ٱللَّهُ وَيَغْفِرْ لَكُمْ ذُنُوبَكُمْ ۗ وَٱللَّهُ
غَفُورٌ رَّحِيمٌ ٣١

(නබි තුමනි ජනතාවට පවසන්නට) ඔබලා සත්‍ය වශයෙන්ම අල්ලාහු තආලා කෙරෙහි භක්තියක් ඇත්තේ නම් මා අනුගමනය කරන්න එවිට අල්ලාහු තආලා ඔබ කෙරෙහි දයාව ආදරය දක්වනු ඇත. ඔබලාගේ පාප කර්ම වලට ඔහු සමාව දෙනු ඇත. අල්ලාහු තආලා සමාව දීමේ සහ අසීමිත ආදරය පෙන්වීමේ දි ප්‍රමුඛ ස්ථානයේ සිටියි. (3.31)

مَّن يُطِعِ ٱلرَّسُولَ فَقَدْ أَطَاعَ ٱللَّهَ ۖ

කෙනෙක් අල්ලාහු තආලාගේ දූතයා අනුගමනය කරන්නේ ද ඔහුට අල්ලාහ් තආලා ගේ ආනිශංස ලැබෙන්නේ ය. (4.80)

وَمَآ ءَاتَىٰكُمُ ٱلرَّسُولُ فَخُذُوهُ وَمَا نَهَىٰكُمْ عَنْهُ فَٱنتَهُوا۟ ۚ

අපගේ දූතයා අපට ලබා දුන් දෙය ඔබ හතට අවංක ව ලබා ගන්න. ඔහු කුමන දෙයින් වලකින ලෙස උපදෙස් දුන්නේ ද ඔබ ඒවායින් වලකින්න. (59.07)

## සුන්නත් පිළිබඳ හදීස් වල සඳහන් කරුණු

සත්‍යවශයෙන් ම මාගේ අල්ලාහ් තආලා මට ලබා දුන් උපදෙස්වලින් ඔබ නොදත් දේ මට දේශනා කරන ලෙස මට උපදෙස් දී ඇත.(මුස්ලිම්)

මම ඔබලා වෙත කාරණා දෙකක් හැර යමි. එය ඔබ නිසියාකාර ව අනුගමනය කරන තෙක් ඔබ කිසි ම විටක නොමග යන්නේ නැත. ඒවා නම් අල් කුර්ආනය සහ මාගේ සුන්නත්, (මුවත්තා)මා නිසි ලෙස අනුගමනය කළ අය ස්වර්ගයට යාම නියත වේ. අන් අය ප්‍රතික්ෂේප වෙති. (බෛහකි) වැනි හදීස් සුන්නත් අනුගමනය කළ යුතු යැයි තරයේ කියා සිටියි. එම නිසා අල් කුර්ආනය "වහි මත්ලුව්"යනුවෙන් ද සුන්නාව "වහි හයිරු මත්ලුව්" යනුවෙන් ද හඳුන්වනු ලැබෙන්නේ මෙනිසා ය.

අල් කුර්ආනය බොහෝ ස්ථානවල (කිතාබ්) ග්‍රන්ථය යන වචනයත් සහ හික්මා (ඥානය) යන වචනයත් සම්බන්ධ කර කියනු ලැබේ. එම දූතයා ඔවුන්ට අල්ලාහු තආලා ගේ වචන පාරායනා කර පෙන්වා ඔහු පාරිශුද්ධ කර ඔහුට ආගම සහ ඥානය (හික්මා) උගන්වන ලදි. (62.2) ඉහත සඳහන් වූ ඥානය යන වචනය සුන්නාව හඳුන්වන බව සාෆිඊ (රහ්) තුමා සලකයි". මට අල් කුර්ආනය සහ ඊට සමාගාමී ව තවත් දෙයක් පිළිගන්වන ලදි" යන හදීසය ඒ සඳහා ඔහු උපයෝගි කරගෙන ඇත.




අල් කුර්ආනය සහ සුන්නත් යන දෙක එකින් එක මත රඳා පවතින පරිපූර්ණ කොටස් දෙකක් ය. අල් කුර්ආනය සහ සුන්නාව පොතක් හා එම පොත අඳුරේ දී කියවීමට රැකුලක් වන ආලෝකයට සමාන කර ඇත. එම නිසා සුන්නත් මගහැර අල් කුර්ආනය තේරුම් ගැනීමට හෝ ක්‍රියාවේ යෙදවීමට හෝ නීති සකස් කිරීමට නොහැකි ය.

මේ පිළිබඳ නිදසුන් කීපයක් බලමු. අල් කුර්ආනය සලාතය නිසි පරිදි අනුග මනය කරන ලෙස මග පෙන්වයි. එනමුත් සලාතය කෙසේ අනුගමනය කළ යුතු ද යන්න සුන්නත් මගින් පැහැදිලි කරයි. සලාත් ඉටු කළ යුතු ක්‍රමවේද පිළිබඳ ව සවිස්තර ව සුන්නාව මගින් පැහැදිලි කරයි.

එක් අවස්ථාවක ඉම්රාන් බින් හුසේන් (රළි) තුමා වෙත කෙනෙක් ආවේ ය. අපට අල් කුර්ආනය හැර වෙනත් කිසිවක් පවසන්න එපා යැයි කී ය. ඔහු තමා සමීපයට කැඳවූ ඉම්රාන් (රළි) තුමා අල් කුර්ආනයේ ලුහර් සලාතයට රකාඅත් හතරක් තිබෙන බව කියනවා ද කඃබාව හත් වරක් තවාෆ් කරන්න ඕනෑ කියා තියෙනවා ද? සෆා සහ මර්වා යන ස්ථාන දෙක අතර "සඊ" කරන්න ඕනෑ කියා තිබෙනවා ද? යැයි අසා සුන්නත්හි වැදගත්කම හුදෙක් පැහැදිලි කළේ ය.

තවත් කෙනෙක් අබ්දුල්ලා ඉබුනු උමර් (රළි) තුමා වෙත කස්රු ජම්උ යන සලාතය අල් කුර්ආනයේ පැහැදිලි කර තිබේ ද? යන්න ඇසී ය. එවිට සහෝදරයා අල්ලාහ් තආලා අපට මුහම්මද් (සල්) තුමා අපගේ දූතයා වශයෙන් එවා ඇත. එතුමා සේම අපි කරන්නෙමු යැයි කී ය. (මුවත්තා)

එමෙන් ම නීති සම්පාදනයට ද සුන්නත් අවශ්‍යය වී ඇත. එසේ ම සොරකමට දඬුවම අත කැපීම යනුවෙන් අල් කුර්ආනයේ සඳහන් කර ඇත. නමුත් සුන්නත්වලින් කුඩා දරුවන් මානසික රෝගීන් වැනි අයට මෙම දඬුවම ලිහිල් කර ඇත. ඒ වගේ ම සොරකමේ වටිනාකම අනුව දඬුවම වෙනස් විය හැක. මැණික්කටුව දක්වා අත ඉවත් කළ හැකි ය. තව ද ආහාර ද්‍රව්‍ය සොරකම් කළා නම් මෙම දඬුවම ක්‍රියාත්මක කළ නොහැකි ය. මෙවැනි විවිධ ක්‍රියාදාම පිළිබඳ විස්තර සුන්නත් මගින් ලබා ගත හැකි ය. තව ද ජනයා සලාතය සකාත් ෆිත්ර්, ඉහ්රාම් ඇඳීම වැනි දෑ පිළිබඳ විස්තර සුන්නත් මගින් ලබා ගත හැකි ය.

සුන්නත් ආරක්‍ෂා කර ගැනීම සඳහා සහාබාවරු, තාබිඊන්වරු, සහ ඉන් පසු ව පැමිණි සමාජවල කැපවීම මනාව පැහැදිලි වෙයි. සහාබාවරු විසින් හදීස් සියල්ල නිවැරදි ව කටපාඩම් කරන ලදි. අක්ෂර පිළිබඳ දැනුම ඇති අය ඒවා ලියා ආරක්‍ෂා කළෝ ය. ඔවුහු දැනගත් හදීස් සියල්ල සාක්ෂි සහිතව පිළිගැන්වූවෝ ය; හදීස් අනුව ක්‍රියා කළෝ ය. අනාගත සමාජයට හදීස් දායාද කිරීම සඳහා විද්වතුන් වෙතට ගියෝ ය; ව්‍යාජ හදීස්වලින් නිවැරදි හදීස් හඳුනා වෙන් කර ගැනීමට නොයෙක් පර්යේෂණවල යෙදුණෝ ය; හදීස් ග්‍රන්ථ නිර්මාණය කළෝ ය; ප්‍රශ්නයක් ඇති වූ අවස්ථාවල හදීස් ආධාරයෙන් නිගමනයකට පැමිණියෝ ය.

ඉහත සඳහන් ක්‍රියාදම තුළ සුන්නත්හි වැදගත්කම අවබෝධ කරගෙන අප එදිනෙදා ජීවිතයේ අනුගමනය කළ යුතු යහපත් පුරුදු හුරු වෙමු.

**ක්‍රියාකාරකම් :-**

1. සුන්නත් ඉස්ලාමයේ මූලික මූලාශ්‍රයයක් බවට තිබෙන කරුණු පැහැදිලි කරන්න.

2. සුන්නාව ආරක්‍ෂා කිරීමට විද්වතුන් අනුගමනය කළ ක්‍රියාදම පිළිබඳ පැහැදිලි කරන්න.

3. සුන්නත් නොමැතිව අල් කුර්ආනය පැහැදිලි කළ නොහැකි ය, යන තේමාව කරුණු සහිතව පැහැදිලි කරන්න.